**දේශීය ණය සහ සංවර්ධන අරමුදල - 2018**
-----------------------------------------------------

**1.1 මතය**
-------

දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

අරමුදලේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**
---------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**
---------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය දේශීය ණය සහ සංවර්ධන අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශ්ව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය

----------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තව ද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේ ද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්,

වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේ ද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, දේශීය ණය සහ සංවර්ධන අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2015 දෙසැම්බර් 25 දිනැති අංක පීඊඩී 1/2015 දරන චක්‍රලේඛය | ප්‍රවාහන දීමනා සඳහා හිමිකමක් නොමැති නියෝජ්‍ය අධ්‍යක්ෂවරියන් දෙදෙනෙකු වෙත විධිමත් අනුමැතියකින් තොරව 2017 නොවැම්බර් මස සිට මසකට රු.17,500 බැගින් රු.490,000ක් ගෙවා තිබුණි. | අදාළ ගෙවීම් කොමසාරිස් මණ්ඩලයේ අනුමැතියට හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ වාචික අනුමැතිය මත සිදුකර ඇත. මෙම ගෙවීම් සිදු කරනු ලැබුවේ ආයතනයට කණ්ඩායම් ප්‍රවාහන කටයුතු ලබාදීමට හැකියාවක් නොමැති බැවින් වන අතර මේ නිසා කණ්ඩායම් ප්‍රවාහනය ලබාදුන්නේ නම් ආයතනය සිදුකළ යුතු වන මුළු ගෙවීමෙන් 80% ක පමණ මුදලක් ඉතිරිකර ගැනීමට හැකි වී ඇත. | චක්‍රලේඛවලට අනුගත විය යුතුය. ලිඛිත තහවුරු කිරීම් මත පමණක් කටයුතු කිරීමට කළමනාකරණයේ අවධානය යොමු කරවමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 32,008,297ක ලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු. 12,915,575ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 19,092,722ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට, ප්‍රදාන ක්‍රමක්ෂය වටිනාකම රු.57,419,467කින් එනම් සියයට 23.4කින් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

| ප්‍රධාන ආදායම්/වියදම් ප්‍රභවය | 2018 | 2017 | විචලනය | විචලනය ප්‍රතිශතයක් ලෙස (%) |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | |
| පොලී ආදායම | 400,599,838 | 404,872,556 | (4,272,718) | (1.1) |
| පොලී වියදම | 137,858,690 | 138,318,476 | (459,786) | (0.3) |
| ශුද්ධ ක්‍රමක්ෂය | 187,976,452 | 245,395,919 | (57,419,467) | (23.4) |
| ණය හානිකරණය | 4,583,799 | (34,762,394) | 39,346,193 | 113.2 |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)2010 අප්‍රේල් 08 දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව අනුමත කළ බඳවා ගැනීමේ පටිපාටිය අනුව අරමුදලේ අධ්‍යක්ෂවරයා ලෙස ස්ථිර නිලධාරියෙකු පත්කර නොමැති අතර ද්විතියන පදනම මත අධ්‍යක්ෂවරයකු බඳවා ගැනීමට හැකි ආකාරයට බඳවා ගැනීමේ පටිපාටිය ද සංශෝධනය කර නොතිබුණි. එබැවින් දිගින් දිගටම වැඩ බැලීමේ තනතුරක් ලෙස පවත්වා ගැනීම හේතුවෙන් කාර්යසාධනයට අහිතකර ලෙස බලපා තිබුණි. | නිත්‍ය නිලධාරියකු පත්කර ගැනීම සඳහා කටයුතු සිදුකරමින් පවතී. | දීර්ඝකාලීනව වැඩ බැලීමේ තනතුරුවල අනුයුක්ත කිරීම ආයතනයේ කාර්යසාධනයට අහිතකර ලෙස බලපාන බැවින් පුරප්පාඩු පිරවිය යුතු වීම. |

| | | |
|---|---|---|
| (ආ)1993 අංක 24 දරන දේශීය ණය සහ සංවර්ධන (සංශෝධන) පනත මගින් සංශෝධිත 1916 අංක 22 දරන දේශීය ණය සහ සංවර්ධන ආඥා පනතේ 03 වන වගන්තියට පටහැනිව කොමසාරිස් මණ්ඩලයේ අනුමැතියකින් තොරව එවකට අදාළ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් ආයතනයේ අධ්‍යක්ෂ තනතුරේ වැඩ බැලීම්/ රාජකාරි ඉටුකිරීම සඳහා ගණකාධිකාරී සේවයේ නිලධාරියෙකු පත්කර තිබුණි. තව ද 2015 හා 2016 වර්ෂවලදී එම නිලධාරියා වෙනුවෙන් රු. 382,056ක වැඩ බැලීමේ වැටුප් සහ ප්‍රවාහන දීමනා රු. 522,000ක් හා ඉන්ධන දීමනා රු.340,849ක් ලෙස එකතුව රු.1,244,905ක් ගෙවා තිබුණි. | අදාළ මුදල් අයකරගැනීම සඳහා සිහි කැඳවීම් ලිපි ද යවා ඇති අතර ගෙවිය යුතු මුදල රු.1,244,905ක් නොව රු.862,849ක් ලෙස නිවැරදි විය යුතුය. | වැඩිපුර ගෙවා ඇති මුදල් අය කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

**3.2** **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

**--------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ)අරමුදල මගින් හා ව්‍යාපෘති මගින් පළාත් පාලන ආයතනවල ව්‍යාපෘති 18 ක් සඳහා ලබා දී ඇති රු.430,152,152ක අක්‍රිය ණය අයකර ගැනීමට ප්‍රමාණවත් වැඩපිළිවෙළක් දියත් කර නොතිබුණි. | ණයගැති ශේෂ අයකරගැනීම සඳහා ඊට අදාළ පළාත් පාලන ආයතන සමග ඍජුවම සාකච්ඡා පවත්වා ඇති අතර, ණය ශේෂ ප්‍රතිව්‍යුහගත කිරීම මගින් ණය අයකර ගැනීමටත් කටයුතු කර ඇත. | ණය ගෙවීම අවිධිමත්ව සිදුකරන අවස්ථාවලදී විධිමත් කර ගැනීමට කෙටිකාලීන හා දිගු කාලීන ක්‍රියාමාර්ග ගත යුතු වීම. |
| (ආ)අරමුදලේ ප්‍රධාන කාර්යය වනුයේ මුදල් ණයට දීම මගින් පොළිය රැස්කර ගැනීම විය. එසේ වුව ද මුළු පොලී ආදායම රු.400,599,838 ක් වුව ද, ඉන් සියයට 32ක් හෙවත් රු. 127,046,108 ක් ස්ථාවර තැන්පතු පොලිය වීම හේතුවෙන් ප්‍රමාණවත් කාර්යසාධන මට්ටමක් ලබා නොතිබුණි. | මේ සම්බන්ධයෙන් කොමසාරිස් මණ්ඩලය ද දැනුවත්කර මෙහෙයුම් කාර්යක්ෂමතාවය ඉහළ නංවා ගැනීමට අවශ්‍ය ක්‍රියාවලියක් සකස් කිරීමට බලාපොරොත්තු වේ. | අරමුණුවලට දායක වන පරිදි සැලසුම්සහගතව කටයුතු කිරීම හා ඉලක්ක කිරීම පිළිබඳ කළමනාකරණයේ අවධානය යොමු කළ යුතු වීම. |

**3.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

-----------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මූල්‍ය, පරිපාලන හා මෙහෙයුම් අත්පොත්වල අවශ්‍යතාව පිළිබඳ අධ්‍යනයකින් තොරව හා අපේක්ෂිත ඉලක්ක හා ප්‍රමිතීන් නියම නොකර මිල සැදහුම් ක්‍රමය යටතේ මිල ගණන් ලබාගෙන අරමුදල සඳහා අත්පොත් සකස් කිරීම වෙනුවෙන් ඇප සුරැකුමක් රහිතව රු. 200,000 අත්තිකාරම් ගෙවා තිබුණි. අත්පොත්වල ප්‍රමාණාත්මක හා ගුණාත්මක බව පිළිබඳව ඇගයීමකින් තොරව ගෙවීමට ඇති ඉතිරි මුදලින් සියයට 50ක් වූ රු. 100,000 ක මුදලක් පාලක සභාවේ ආවරණ අනුමැතියට යටත්ව ගෙවා තිබුණි. | මෙම ආයතනයේ ක්‍රියාකාරී අත්පොත් පිළියෙල කරනු ලැබුවේ 2016 වසරේ සිට ක්‍රියාත්මක ආයතනය ප්‍රතිව්‍යුහගතකරණ වැඩසටහනට අනුව 2017 වසරේදී නිකුත් කළ අවසන් වාර්තාවේ නිර්දේශය මතය. ඒ අනුව 2018 වසරේ ආයතනයේ ක්‍රියාකාරී සැලැස්මට මෙම කාර්යය ඇතුළත් කර ඇති අතර, විගණන සහ කළමනාකරණ කමිටුවේ නිර්දේශයන් මත 2017 දෙසැම්බර් 15 දින පැවති කොමසාරිස් මණ්ඩලයේ අනුමැතිය හිමිවී ඇත. ඒ අනුව ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් ආයතනයේ මූල්‍ය අංශය ප්‍රතිව්‍යුහගත කිරීම යටතේ මූල්‍ය අත්පොත ද, මානව සම්පත් හා පරිපාලන අත්පොත් ද පිළියෙල කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත. අත්පොත්වල ගුණාත්මක බව හා ප්‍රමාණවත් බව පරීක්ෂා කිරීම සඳහා 2019 අප්‍රේල් 04 දින සභාපතිතුමන් විසින් කමිටුවක් පත්කර ඇති අතර ඒ අනුව අවශ්‍ය වෙනස්කිරීම් කර අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරමි. | ප්‍රසම්පාදන චක්‍ර ලේඛයට අනුගත විය යුතුය. |

**3.4 මානව සම්පත් කළමනාකරණය**

-------------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අරමුදල විසින් සේවයේ නියුක්ත කරන ලද සංවර්ධන නිලධාරීන් 15 දෙදෙනෙකු දීප ව්‍යාප්තව පිහිටි සහකාර කොමසාරිස් කාර්යාලවලට අනුයුක්ත කර තිබෙන අතර, ඔවුන්ගෙන් ආයතනයට උපරිම සේවයක් ලැබෙන පරිදි සේවයේ නියුක්ත කිරීමට ප්‍රමාණවත් වැඩ පිළිවෙලක් සකස් කර නොතිබුණි. | අදාළ සංවර්ධන නිලධාරීන් සඳහා රාජකාරී ලැයිස්තු මේ වසරේ සංශෝධනය කර නිවැරදි කරන ලද අතර, ඔවුන්ව නියාමනය සඳහා වැඩපිළිවෙළක් ඉදිරියේදී සකස් කිරීමට බලාපොරොත්තු වේ. | විධිමත් පරිදි රාජකාරි පැවරීම් කර කාර්යසාධනය ළඟා කරගත හැකි පරිදි කටයුතු කිරීම පිළිබඳ කළමනාකරණයේ අවධානය යොමු කරවමි. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 තිරසාර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තිරසාර සංවර්ධනය පිළිබඳ "එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය " ප්‍රකාරව සමාලෝචිත වර්ෂයට අදාළව අරමුදල විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් පිළිබඳ දැනුවත් වී නොතිබුණි. ඒ හේතුවෙන් තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක මැන බැලීමේ දර්ශක හඳුනාගෙන නොතිබුණි. | තිරසාර සංවර්ධන අරමුණු 2019 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර ඇත. | තිරසර සංවර්ධන ඉලක්ක හඳුනාගෙන නිශ්චිත නිලධාරීන්ට වගකීම් පැවරෙන පරිදි කටයුතු කිරීමට කළමනාකරණයේ අවධානය යොමු කරවමි. |